සැ. යු. - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2018 වර්ෂය සඳහා කොළඹ දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,087 - 2018 අගෝස්තු මස 31 වැනි සිකුරාදා - 2018.08.31**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1280 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 1285 |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - බුද්ධිමය දේපළ (සංශෝධන) පනත් කෙටුම්පත 2018 අගෝස්තු මස 24 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2018 සැප්තැම්බර් මස 21 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 සැප්තැම්බර් මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

## පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව (වයඹ පළාත)

## රජයේ ඉඩම් ආඥාපනත යටතේ අන්සතු කිරීමට ඇති ඉඩම් සඳහා අවසරපත්‍ර ලැබීමට ගොවිජන පන්තියට අයත් තැනැත්තන් නොවන තැනැත්තන් තෝරා ගැනීම සඳහා ඉඩම් කච්චේරි පිළිබඳ නිවේදනය

පහත විස්තරකර ඇති ඉඩම් සඳහා ඉල්ලුම්පත් සළකා බැලීමට සහ ඒවායේ ඉඩම් කොටස් සඳහා අවසරපත්‍ර ලැබීමට සුදුසු තැනැත්තන් තෝරා ගැනීමට පඬුවස්නුවර ප්‍රාදේශීය ලේකම් වරයා විසින් 2018.11.30 දින පෙ. ව. 10.00ට පඬුවස්නුවර - ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| *(අ)* | දිස්ත්‍රික්කය | : | කුරුණෑගල |
| *(ආ)* | උප දිසාපති හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසය | : | පඬුවස්නුවර - බටහිර |
| *(ඇ)* | ග්‍රාම නිලධාරි වසම | : | 1348 - නිකපිටිය |
| *(ඈ)* | ඉඩම පිහිටි ගම | : | එගොඩ ගෙදර |
| *(ඉ)* | ඉඩමේ නම | : | බටුහේන |
| *(ඊ)* | ඉඩමේ විස්තරය | : | නිකපිටිය |
| *(උ)* | අන්සතු කිරීමට ඇති ඉඩමේ ස්වභාවය (වාරිමාර්ග පහසුකම් සලසන ලද හා / හෝ වාරිමාර්ග පහසුකම් සලසා නොමැති) | : | වාරිමාර්ග පහසුකම් සලසා නොමැති ගොඩ ඉඩම. |
| *(ඌ)* | අන්සතු කරනු ලබන ඒකකය | : | ව්‍යාපාරික කටයුතු සඳහා අවම හෙක්. 0.404. සිට හෙක් 0.560 දක්වා. |

2. පඬුවස්නුවර-බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පහත සඳහන් පන්ති වලට අයත් ලැබෙන ඉල්ලුම්පත්‍ර සලකා බලනු ලැබේ.

- නගර සීමාව තුළ ව්‍යාපාරික කටයුතු සඳහා දීර්ඝකාලීන බදු බලපත්‍ර සකස් කිරීමට බලාපොරොත්තු වන ඉ. කො. 157 ලේඛනයේ ලියාපදිංචි වූ රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් ලබාගැනීමට සුදුසු ආදායම් කාණ්ඩයට අයත් අය.

3. සියලුම ඉල්ලුම්පත්‍ර 2018.11.08 වැනි දින හෝ ඊට පෙර ප්‍රාදේශීය ලේකම්, පඬුවස්නුවර බටහිර වෙත ලැබිය යුතුය. සියලුම ඉල්ලුම්පත්‍ර නියමිත ආකෘතියේ විය යුතුය.

4. ඉල්ලුම්කරු ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට සුදුසු වන්නේ නම් 2018.11.30 දින පෙ. ව. 10.00ට පඬුවස්නුවර-බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පැවැත්වෙන ඉඩම් කච්චේරියට පැමිණෙන ලෙස ප්‍රාදේශීය ලේකම් වරයා ඔහුට නියම කරනු ලැබේ. ඉඩම් ලැබීම සඳහා සලකා බලනු ලැබීමට කැමති සෑම තැනැත්තෙක්ම පෞද්ගලිකව පැමිණිය යුතුය. එසේ නැතහොත් තමන් නියෝජනය කිරීම සඳහා වෙනත් අයෙකු ලියවිල්ලක් මගින් ඉදිරිපත් කළ යුතුය.

5. ඉල්ලුම්කරු හෝ ඔහු නියෝජනය කරන තැනැත්තා හෝ විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සනාථ කෙරෙන සියලුම සාධක හෝ ප්‍රාදේශීය ලේකම් වරයා විසින් නියම කරන වෙනත් අදාළ තොරතුරු ඉඩම් කච්චේරියේ දී ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

6. තෝරා ගනු ලබන සෑම අයදුම්කරුවෙකුටම මුල් අවස්ථාවේ අවසර පත්‍රයක් ලැබෙන අතර එය, එහි සඳහන් කොන්දේසි වලට යටත් වනු ඇත.

7. අවසර පත්‍රයක් ලැබීමට තෝරාගනු ලබන සෑම තැනැත්තෙක්ම එසේ තෝරා ගනු ලැබූ බව දන්වනු ලැබූ වහාම තමන් තෝරාගනු ලැබී ඇත්තේ කවර ඉඩමක් සඳහා ද, ඒ ඉඩම වෙනුවෙන් පර්චස් එකකට රු. 150ක් බැගින් ගණන් බලනු මුදලක් තැන්පත් කළයුතුවේ. මෙම තැන්පතුව සඳහා ආපසු නොගෙවනු ලබන නමුත් තේරුණු තැනැත්තා විසින් ගෙවිය යුතු ගැනුම් මිලට එය හිලව් කරනු ලැබේ.

ඉහත සඳහන් ඉඩම් කච්චේරිය පිළිබඳ විස්තර පහත දැක්වෙන තැනැත්තන්ගෙන් හා ඔවුන්ගේ නම ඉදිරියෙන් ඇති ස්ථාන වලින්ද ලබාගත හැක.

- සහකාර ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පඬුවස්නුවර - බටහිර
- ජනපද නිලධාරි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පඬුවස්නුවර - බටහිර.
- ග්‍රාම නිලධාරි, 1348 - නිකපිටිය, ග්‍රාම නිලධාරි කාර්යාලය, නිකපිටිය.

ඉඩම් කොමසාරිස්.

2018 අගෝස්තු මස 08 වැනි දින.

**රජයේ ඉඩම් ආඥාපනත යටතේ නේවාසික හා ................ වානිජමය ................................. කටයුතු සඳහා ඉඩම් ලබාදීමට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක ............................................................................................................................. යන වසම් වල පදිංචිකරුවන් අතරින් තෝරාගනු ලැබීම සඳහා ඉල්ලුම්පත්‍රය**

1. සම්පූර්ණ නම :...........................................................................................................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය :.................................................................................................

3. ලිපිනය :.........................................................................................................................................................................

4. ඡන්ද බලය ලබා ඇති මැතිවරණ කොට්ඨාසය :...............................................................................................................

5. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :...........................................................................................................

6. ගෘහ මූලික අංකය :....................................................................................................................

7. ස්ත්‍රී/පුරුෂ භාවය :....................................................................................................................

8. වයස (අයදුම්පත් භාරගන්නා අවසාන දිනට) :.................................................................................

9. උපන් දිනය :................................................................................................

10. විවාහක/අවිවාහක :...........................................................................................

11. රැකියාව :...........................................................................................................

12. රැකියාව කරන ස්ථානය :..................................................................................

13. අයදුම්කරු කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) ඇතුලු මුළු වාර්ෂික ආදායම :

| *නම* | *අයදුම්කරුට ඇති සම්බන්ධය* | *රැකියාව* | *වාර්ෂික ආදායම* |
|---|---|---|---|
| | | | |

12. ඉල්ලුම්කරු සහ යැපෙන්නන් සතු ඉඩම් වල විස්තර :-

| *ඉඩමේ නම* | *ප්‍රමාණය* | *අයිතියේ ස්වභාවය* | *පවුලේ පළවෙනි ඉඩමක් නම් පවුලේ අයට හිමි කොටස්* |
|---|---|---|---|
| | | | |

13. කාලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) රජයේ සේවකයෙකු හෝ සන්නද්ධ හමුදාවක සේවය කරන්නේ නම් ඔහුගේ/ ඇයගේ රාජකාරි ලිපිනය :...........................................................................................................................................

14. දැනට තමා පදිංචි නිවසේ තත්වය:- (තමාගේද/බද්දටද/කුලියටද/අනවසරයෙන් ද යන වග) :...................................................

15. නිවස පිහිටි ස්ථානය :...........................................................................................................................................

16. යැපෙන දරුවන් පිළිබඳ විස්තර :.......................................................................................................................

17. ඉගෙනුම ලබන දරුවන් පිළිබඳ විස්තර :

| නම | වයස | ඉගෙනුම ලබන්නේ නම් පාසලේ/විදුහලේ නම | ඉගෙනුම ලබන පංතිය/ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |

18. ඔබ හෝ කලත්‍රයා විසින් ඉඩමක් හෝ නිවසක් මිලදී ගැනීම සඳහා රජයෙන් හෝ සේවය කරන ආයතනයෙන් ණය මුදලක් ලබාගෙන ඇත්ද ? ලබාගෙන ඇත්නම් පහත සඳහන් විස්තර සපයන්න.

(i) ලබාගත් ණය මුදල :.......................................................................................................................
(ii) ණය ලබාගත් ආයතනයේ/ දෙපාර්තමේන්තුවේ නම :.......................................................................................
(iii) දැනට ගෙවීමට ඇති ශේෂය :.......................................................................................................................

19. පවුලේ යම් සාමාජිකයෙක් මුදල් ඉතිරි කර තිබේ ද ? තිබේනම් විස්තර සපයන්න.

| පවුලේ සාමාජිකයාගේ නම | ඉතිරි කිරීමේ ගිණුම පවත්වාගෙන යන ආයතන | ඉතිරි කළ මුදල |
|---|---|---|
| | | |
| | | |

20. ඉඩම් ලාභියෙකු වශයෙන් යථා කාලයේදී තෝරාගනු ලැබුවහොත් ඉඩමේ වටිනාකම රජය තීරණය කරනු ලබන අන්දමට ගෙවීමට එකග වන අතර, ඉඩම බදු ගැනීමෙන් අනතුරුව මාස 06 ක කාල සීමාවක් තුළ ඉඩමේ නිවසක් ඉදිකිරීම සඳහා කටයුතු කිරීමට එකඟ වෙමි. මා විසින් ඉදිරිපත් කරන තොරතුරු තෝරා ගැනීමෙන් පසුව වුව ද අසත්‍යයක් බව හෙළි වුවහොත් මගේ තෝරා ගැනීම ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැකි බවත් දනිමි.

......................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :.....................................

ඉහත අයදුම්කරු විසින් ඡේද අංක 1-19 දක්වා ප්‍රකාශ කර ඇති තොරතුරු මා පරීක්ෂා කළ බවද එම තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බවද මෙයින් සහතික කරමි.

නම :.................................................................................
ග්‍රාම නිලධාරි කොට්ඨාසය :..........................................

......................................,
ග්‍රාම නිලධාරි අත්සන.

නම :..............................................................
ලිපිනය :........................................................

..................................................,
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන.

**දිවුරුම් ප්‍රකාශය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පඬුවස්නුවර-බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ................................................................. ග්‍රාම නිලධාරි වසමේ පදිංචි .......................................................................................................... වන මම, පහත පරිදි දිවුරා ප්‍රකාශ කරමි.

(1) මට ද මාගේ කාලත්‍රයාටද සහ වයස අවුරුදු 18ට අඩු මාගේ දරුවන්ටද සාමූහිකව ශ්‍රී ලංකාව තුළ (රජයේ ඉඩම සහ පුද්ගලික ඉඩමද ඇතුළුව) අක්කර 50 කට (පනහකට) අඩුවෙන් තිබෙන බවට සහ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට හෝ 1973 අංක 01 දරන නිවාස දේපළ උපරිම පනත යටතේ හෝ ප්‍රකාශයක් කර නැති බවටද සහතික කරමි.

(2) එසේම ඉහත කී අක්කර ...................... රූඩ් .................... පර්. ...................... ක් වූ ඉඩම පවරා ගැනීමෙන්, මිලදී ගැනීමෙන් පසුව වුව ද, ඉහත ඡේදයේ සඳහන් කර ඇති අක්කර පනහේ (50) සීමාව නොඉක්මවන බවත්, වැඩිදුරටත් සහතික කරමි.

........................................,
දිවුරුම්කරුගේ අත්සන.

ඉහත සඳහන් දිවුරුම්කරු/කාරිය මෙහි අඩංගු දෑ කියවා තේරුම්කර දුන් අතර/ ඇය මෙහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගැනීමෙන් පසුව මා ඉදිරියේ අත්සන් තැබූ බවත් සහතික කරමි.

....................................................,
සාමදාන විනිශ්චයකාර තැන.

08-965

---

**වයඹ පළාත් සභාව**

1946 අංක 57 දරන පොදු සුසාන හා පුද්ගලික සුසාන පිළිබඳ ආඥාපනතේ 11 පරිච්ඡේදයේ 5(1) යටතේ කරනු ලබන දැන්වීම

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ දෙවැනි වගන්තියේ (11) උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 1946 අංක 57 දරන පොදු සුසාන භූමි හා පුද්ගලික සුසාන භූමි පිළිබඳව ආඥාපනතේ 11 පරිච්ඡේදයේ 5 (1) වගන්තියෙන් පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වයඹ පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ පළාත් පාලන විෂය භාර අමාත්‍ය වන දසනායක ගුණරත්න බස්නායක මුදියන්සේලාගේ ධර්මසිරි දසනායක වන මා විසින් වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත උපලේඛනයෙහි සඳහන් සුසාන භූමි මළමිනී වැළලීම හෝ ආදාහනය කිරීම පිණිස පොදු සුසාන ලෙස මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

දසනායක ගුණරත්න බස්නායක මුදියන්සේලාගේ ධර්මසිරි දසනායක,
වයඹ පළාතේ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය,
අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන,
පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය.
වයඹ පළාත් සභාව.

2017 දෙසැම්බර් මස 29 වැනි දින,
කුරුණෑගල ප්‍රධාන අමාත්‍ය කාර්යාලය.

**උපලේඛනය**

01. *නල්ලච්චිය සුසාන භූමිය :*

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 40, නල්ලච්චිය ග්‍රාම නිලධාරී වසමේ නල්ලච්චිය ගමේ අ.ග.පි. 3427 හි කැබලි අංක 57 දරන ප්‍රමාණයෙන් අක්කර 03 රූඩ් 01 පර්චස් 02ක් (හෙක්ටයාර් 01ක් සහ හෙක්ටයාර් 01කින් දහසෙන් පංගු 320 ක් (1.32) ) උතුරට : කැබලි අංක 56 ද, නැගෙනහිරට : කැබලි අංක 58 ද, දකුණට : මැදවච්චිය ගම් මායිම අ.ග.පි. 3419 ද, බස්නාහිරට : කැබලි අංක 55 වන නල්ලච්චිය හේන නම් වූ රජයේ ඉඩම.

(අංක වී/කු 20 දරන රේඛා සටහන)

02. *කාටුවැව සුසාන භූමිය :*

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 42, කාටුවැව ග්‍රාම නිලධාරි වසමේ, කාටුවැව ගමේ අ.ග.පි. 3406 හි කැබලි අංක 11 දරන ප්‍රමාණයෙන් අක්කර 03 පර්චස් 29 ක් වූ උතුරට : කැබලි අංක 106, නැගෙනහිරට : කැබලි අංක 106 සහ 16 ද, දකුණට : කැබලි අංක 16 සහ 12 ද, බස්නාහිරට : කැබලි අංක 12 සහ 106 ද ගම් මායිම කාටුවැව නම් වූ රජයේ ඉඩම.

03. *තෝරව සුසාන භූමිය :*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 44, තෝරව ග්‍රාම නිලධාරි වසමේ මහතෝරව ගමේ අ.ග.පි. 3407 හි කැබලි අංක 44 දරන ප්‍රමාණයෙන් අක්කර 02 පර්චස් 16 ක් වූ උතුරට : කැබලි අංක 32ක් ද, නැගෙනහිරට : උඩතෝරව ගම් මායිම ද, දකුණට : කැබලි අංක 45 ද, බස්නාහිරට : කැබලි අංක 32 ගම් මායිම ද වන දන්ගහ කැරකොප්පුව නම් වූ රජයේ ඉඩම.

04. *නාහෙට්ටිකුලම සුසාන භූමිය :*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 45, නාහෙට්ටිකුලම ග්‍රාම නිලධාරි වසමේ තිඹිරියාව ගමේ අ.ග.පි. 3299 හි කැබලි අංක 09 දරන ප්‍රමාණයෙන් අක්කර 01 පර්චස් 38 ක් වූ උතුරට : කැබලි අංක 06ක් ද, නැගෙනහිරට : කැබලි අංක 08ක් ද, දකුණට : කැබලි අංක 08ක් ද, බස්නාහිරට : කැබලි අංක 08 ගම් මායිම ඇහැටුගහපිටිය නම් වූ රජයේ ඉඩම.

05. *ඉහළගම (තාඹරේ) සුසාන භූමිය :*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 46, ඉහළගම ග්‍රාම නිලධාරි වසමේ තාඹරේ ගමේ අ.ග.පි. 3290 හි කැබලි අංක 08 දරන ප්‍රමාණයෙන් රූඩ් 02 යි පර්චස් 31 ක් වූ උතුරට : කැබලි අංක 6 සහ 7 ද, නැගෙනහිරට : කැබලි අංක 07 ද, දකුණට : කැබලි අංක 54 ද, බස්නාහිරට : කැබලි අංක 06 ගම් මායිම තවලම්පිටිය හේන නම් වූ රජයේ ඉඩම.

06. *නොච්චිය (අඹගහපිටිය) සුසාන භූමිය :*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 48, නොච්චිය ග්‍රාම නිලධාරි වසමේ නොච්චිය ගමේ අ.ග.පි. 3743 හි කැබලි අංක 27 දරන ප්‍රමාණයෙන් රූඩ් 03 යි පර්චස් 35 ක් වූ උතුරට : කැබලි අංක 28 ක් ද, නැගෙනහිරට : කැබලි අංක 54 ක් ද, දකුණට : කැබලි අංක 32 ක් ද, බස්නාහිරට : කැබලි අංක 26 ගම් මායිම අඹගහපිටිය නම් වූ රජයේ ඉඩම.

07. *කොහොඹන්කුලම සුසාන භූමිය :*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 49, කොහොඹන්කුලම ග්‍රාම නිලධාරි වසමේ කොහොඹන්කුලම ගමේ අ.ග.පි. 3498 හි කැබලි අංක 124 දරන ප්‍රමාණයෙන් අක්කර 01 යි පර්චස් 05 ක් වූ උතුරට : කැබලි අංක 123, නැගෙනහිරට : කැබලි අංක 26 ද, දකුණට : කැබලි අංක 26, බස්නාහිරට : කැබලි අංක 26 ගම් මායිම දුනුගමඩලවත්ත නම් වූ රජයේ ඉඩම.

08. *පලුගොල්ල සුසාන භූමිය :*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 50, පලුගොල්ල ග්‍රාම නිලධාරි වසමේ පලුගොල්ල ගමේ අ.ග.පි. 3422 හි කැබලි අංක 20 දරන ප්‍රමාණයෙන් අක්කර 02 යි පර්චස් 20 ක් වූ උතුරට : කැබලි අංක 18 සහ 19, නැගෙනහිරට : කැබලි අංක 18 සහ 21, දකුණට : කැබලි අංක 21 සහ 22, බස්නාහිරට : කැබලි අංක 19 සහ 22 ගම් මායිම සියඹලාගහ කැරකොප්පුව නම් වූ රජයේ ඉඩම.

09. *පලුගොල්ල (තම්මැන්න වැටිය) සුසාන භූමිය :*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 50, පලුගොල්ල ග්‍රාම නිලධාරි වසමේ පලුගොල්ල ග්‍රාම නිලධාරි වසමේ තම්මැන්නාවැටිය ගමේ අ.ග.පි. 3421 හි කැබලි අංක 21 දරන ප්‍රමාණයෙන් අක්කර 03 යි පර්චස් 26 ක් වූ උතුරට : කැබලි අංක 48, නැගෙනහිරට : කැබලි අංක 48 සහ 20, දකුණට : කැබලි අංක 20 සහ 22, බස්නාහිරට : කැබලි අංක 22 සහ 48 ගම් මායිම සෝනියගල මූකලාන නම් වූ රජයේ ඉඩම.

10. *මහගල්ගමුව (ගොජරාගම) සුසාන භූමිය :*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 60, මහගල්ගමුව ග්‍රාම නිලධාරි වසමේ ගොජරාගම ගමේ අ.ග.පි. 3198 හි කැබලි අංක 33 දරන ප්‍රමාණයෙන් පර්චස් 34 ක් වූ උතුරට : කැබලි අංක 37 නැගෙනහිරට : හොරොව් ඇල සහ දකුණට : කැබලි අංක 45, බස්නාහිරට : කැබලි අංක 45 සහ 34 ගම් මායිම අම්බලන්ගල මූකලාන නම් වූ රජයේ ඉඩම.

11. *පොරොත්තුකඩවල සුසාන භූමිය :*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 64, පොරොත්තුකඩවල ග්‍රාම නිලධාරි වසමේ අ.ග.පි. 3853 හි කැබලි අංක 258 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0587 ක් වූ උතුරට : කැබලි අංක 257 සහ වලස්වැව ගම් මායිම, නැගෙනහිරට : කැබලි අංක 257 සහ 259, දකුණට : කැබලි අංක 259, බස්නාහිරට : වලස්වැව ගම් මායිම වැව් ඉහළ යාය නම් වූ රජයේ ඉඩම.

11. *පාලුකඩවල සුසාන භූමිය :*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 73, පාලුකඩවල ග්‍රාම නිලධාරි වසමේ ක.සි 420017 දරන පිඹුරේ කැබලි අංක 178 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.3022 ක් වූ, උතුරට : කැබලි අංක 174, නැගෙනහිරට : කැබලි අංක 179, දකුණට : කැබලි අංක 179, බස්නාහිරට : කැබලි අංක 208 දරන පාලුකඩවල ගම් මායිම මහපිටයේයාය නම් වූ රජයේ ඉඩම.

08-1139

---

# අතුරු ව්‍යවස්ථා

## බළන්ගොඩ නගර සභාව

අතුරු ව්‍යවස්ථා

255 වන අධිකාරි බලය යටතේ පවතින නගර සභා ආඥාපනතේ 153 හා 154 වන වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාරව සබරගමුව පළාත් සභා පරිපාලන බල ප්‍රදේශයේ බළන්ගොඩ නගර සභාව විසින් සම්මත කර ඇති පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව, නගර සභා ආඥාපනතේ 154 වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සබරගමුව පළාත් සභාවේ ආණ්ඩුකාරවර වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

නිලූකා ඒකනායක,
ආණ්ඩුකාරවර,
සබරගමුව පළාත.

වර්ෂ 2018 ජූලි මස 12 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

**බළන්ගොඩ නගර සභාවේ සතිපොළ පවත්වාගෙන යාම, විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. 1939 අංක 61 දරන නගරසභා ආඥාපනත *හෙවත්* 255 වන අධිකාරයේ 153(1) උප වගන්තිය සමග කියවිය යුතු 157 වන වගන්තිය යටතේ බළන්ගොඩ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පැනවේ.

අතුරු ව්‍යවස්ථාව සෑදීමට සභාව සතු බලය/ නීතිමය ප්‍රතිපාදන.

අතුරු ව්‍යවස්ථාවේ විෂය හා අරමුණු.

2. බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ සතිපොළ පවත්වාගෙන යාම, විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම.

නාමය.

3. මෙම අතුරු ව්‍යවස්ථාව බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ සතිපොළ පවත්වාගෙන යාම, විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

ඉටුකළ යුතු කාර්යයන්.

4. සතිපොළේ සියලුම ගොඩනැගිලි ගඩොලින්, ගල්වලින් හෝ ස්ථිර ඉදිකිරීම් ද්‍රව්‍යයකින් හෝ ඉදිකර තිබිය යුතු අතර සෑම සතිපොළ ගොඩනැගිල්ලකම බිමට කොන්ක්‍රීට් යොදා පොළව මට්ටමේ සිට අවමය අඩි එකක පමණ උසින් සිටින සේ ගෙබිම ඉදිකර තිබිය යුතුය.

5. වහලය කිසියම් ස්ථිර සෙවිලි ද්‍රව්‍යයකින් ඉදිකර තිබිය යුතුය. එමෙන්ම සෑම වහලයකම රැස්වෙන වැසි ජලය බැස යාමට ස්ථිර ක්‍රම වේදයක් සකස් කර තිබිය යුතුය.

6. කිසියම් සාධාරණ විශේෂිත අවස්ථාවක හැර ගොඩනැගිල්ල ඇතුළත වෙළඳ කඩකාමර පේළි දෙකක් අතර අවම පරතරය මීටර් 2ක් පළලින් සමන්විත විය යුතුය. එම පදික කොටස පාරිභෝගියකයන්ගේ ගමනා ගමනයට උචිත පරිදි ස්ථිර ඉදිකිරීම් ද්‍රව්‍යයකින් ඉදිකර තිබිය යුතු අතර, මගී ගමනා ගමනයට බාධා නොවන ආකාරයට වැසි ජලය බැස යාමට සලස්වා තිබිය යුතුය.

7. සතිපොල ඇතුළත ඉදි කරනු ලබන සෑම වෙළෙඳ මැස්සක්ම ගඩොලින් හෝ සිමෙන්ති ගලෙන් හෝ කබොක් ගලෙන් ඉදිකළ බැම්මක් මත කොන්ක්‍රීට් තහඩුවකින් හෝ මළ නොබැඳෙන ලෝහ තහඩුවකින් නිම කළ තට්ටුවකින් යුක්ත විය යුතුය. කෙසේ වුවද කොන්ක්‍රීට් තහඩුවකින්, තට්ටුවකින් නිම කර ඇති විට එකී තට්ටුව කපරාරු කර සිමෙන්තියෙන් ඔපදමා හෝ පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතු ය. ඒ ආකාරයෙන් වෙළඳ මැහි තැනීමට අවශ්‍ය නොවන යම් අවස්ථාවක එක් එක් කොටස වෙන් කෙරෙන ඉරි සළකුණු සුදු වර්ණයෙන් සලකුණු කර තිබිය යුතුය.

8. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයට හා විශේෂ අවශ්‍යතා සහිත පුරවැසියන් සඳහා විශේෂ පහසුකම් සහිත වෙන වෙනම සැකසූ වැසිකිළි හා කැසිකිළි ප්‍රමාණවත් සංඛ්‍යාවක් තනා තිබිය යුතු අතර, එකී සෑම වැසිකිළියකම බිත්තිය මීටර් එකක් උසට හා ගෙබිමද පිඟන් ගඩොල් අල්ලා තිබිය යුතුය.

9. සතිපොළ පරිශ්‍රය තුළ සභාව විසින් අනුමත කළ සැළැස්මකට අනුව ආපන ශාලාවක් හෝ තේ හෝ කෝපි කඩයක් ඉදිකර පවත්වාගෙන යාම නීත්‍යානුකූල වන්නේය.

10. සතිපොළ සෑම වෙළඳ ස්ථානයකට ම අවශ්‍යතාවය අනුව භාවිත කිරීම සඳහා විදුලි සැපයුමක් ලබාදීම සභාවේ කාර්ය වන්නේය.

11. සතිපොළෙහි වෙළඳ ස්ථානවල පිහිටීම සැලකිල්ලට ගනිමින් නගර සභාව විසින් මස්, මාළු, කරවල, එළවළු, පළතුරු සිල්ලර බඩු හා වෙනත් වෙළඳ ද්‍රව්‍ය විකිණීම සඳහා සතිපොළ කොටස්වලට බෙදා වෙන් කිරීමද, එහි පිරිසැකැස්ම සතිපොළ ප්‍රවේශ ස්ථානයේ ප්‍රදර්ශනය කිරීමද නගර සභාවේ කාර්යය විය යුතුය.

12. පරිශ්‍රය තුළ ජනනය වන අපද්‍රව්‍ය

i. ජෛව හායන අපද්‍රව්‍ය,
ii. වීදුරු,
iii. කඩදාසි හෝ කඩදාසි ආශ්‍රිත ද්‍රව්‍ය,
iv. පොලිතින් හෝ ප්ලාස්ටික් හෝ පොලිතින් හා ප්ලාස්ටික් ආශ්‍රිත ද්‍රව්‍ය සහ රිජිෆෝම්,
v. යකඩ හා වෙනත් ලෝහ ද්‍රව්‍ය හෝ යකඩ හා වෙනත් ලෝහ සම්මිශ්‍රණ කොටස්,
vi. අන්තරායකර අපද්‍රව්‍ය.

වෙන වෙනම රැස්කළ හැකි බක්කිය හෝ භාජන හෝ ටැංකි සතිපොළෙහි වෙනම ස්ථානයක තබා තිබිය යුතු අතර, ජෛවහායන අපද්‍රව්‍ය බහාලීම සඳහා තනනු ලැබූ බක්කිය හෝ භාජන හෝ ටැංකි මීයන්ට, මැස්සන්ට වෙනත් කෘමීන්ට හෝ කවර හෝ පක්ෂියෙකුට ඇතුළුවීමට නොහැකි වන ආකාරයෙන් හොඳින් වසා තැබීම හෝ පරිශ්‍රයේ ජනනය වන කසල බැහැර කිරීමේ විධිමත් ක්‍රමයක් සකසා තිබිය යුතුය.

13. කවර හෝ සතිපොළක වෙළඳාම සඳහා වෙන්කළ ඉඩ ප්‍රමාණයන් සභාව විසින් නිශ්චිතව සළකුණු කළ යුතුය.

14. සතිපොළෙහි වෙළඳාමේ නියුක්ත වූවන් තම ව්‍යාපාර කටයුතු අවසානයේ දී තමන් වෙළඳාමේ නියුක්ත වෙළඳ පරිශ්‍රය හෝ මැස්ස අවස්ථාවන්ට උචිත පරිදි සෝදා පිරිසිදු කිරීම කළ යුතුය.

15. සතිපොළෙහි වෙළඳාම් අවසන් කර වෙළඳපොළ සම්පූර්ණයෙන් ම වසා තබන අවස්ථාවක සහ සතිපොළෙහි කිසියම් වෙළෙඳ මැස්සක් වසා දමා බැහැරට යන සෑම අවස්ථාවකදී එකී වෙළඳ පරිශ්‍රයේ සියලුම විදුලි පහන්, විදුලි පංකා සහ වෙනත් විදුලි උපකරණ අක්‍රීය කර දැමීම කළ යුතු ය.

16. විකිණීම සඳහා සතිපොළ වෙත රැගෙන එනු ලබන කවර හෝ ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් හෝ වෙළඳාම සඳහා යොදා ගන්නා කිසියම් උපකරණයක් හෝ වෙනත් යම් කවර හෝ දෙයක් එකී ද්‍රව්‍ය හෝ භාණ්ඩ සතිපොළ තුළට රැගෙන එනු ලබන අවස්ථාවක දී හෝ ඉන් බැහැරට ගෙන යනු ලබන අවස්ථාවක දී හැර වෙනත් කවර හෝ අවස්ථාවක දී ඉහත 07 වන වගන්තියෙන් සඳහන් කරන ලද වෙළඳාම සඳහා වෙන් කර ඇති සීමාවෙන් පිටත තැබීම හෝ එසේ කිරීමට ඉඩ දීම හෝ නොකළ යුතු ය. නොකළ යුතු කාර්යයන්.

17. සතිපොළ ඇතුළත සීමා සළකුණු කර වෙළඳ කටයුතු සඳහා අවසර දී ඇති පරිශ්‍රය තුළ හා වෙළඳාමේ නිරත වීම සඳහා අවසර ලබා දී ඇති ස්ථානවල හැර සතිපොළේ වෙනත් කවර ස්ථානයක හෝ වෙළඳාම නොකළ යුතු අතර, පදික කොටස්වල ගමන් කරනු ලබන තැනැත්තන්ට බාධාවන ආකාරයේ කිසිදු ක්‍රියාවක් නොකළ යුතු ය.

18. 9 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ස්ථානයක හැර සතිපොළ පරිශ්‍රය තුළ වෙනත් කවර හෝ ස්ථානයක ඉවුම් පිහුම් කිරීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

19. බළන්ගොඩ නගර සභාව සතු කිසියම් සතිපොළක,

I. ඇතුළත අසංවරව හැසිරීම හෝ කළකෝලහල කිරීම හෝ මත්ද්‍රව්‍ය, මත්පැන් පානය කර හැසිරීම හෝ අසභ්‍ය වචන පාවිච්චි කිරීම හෝ හිඟමන් ඉල්ලීම,

II. දෛනික කටයුතු අවසානයේ සතිපොළ වසා දැමීමෙන් අනතුරුව එහි පරිශ්‍රය ඇතුළත රැඳී සිටීම,

III. කිසියම් ගොඩනැගිල්ලකට ඉදිකිරීමකට හෝ සවි කිරීමකට හෝ අලංකරණය පිණිස වවා ඇති හෝ තබා ඇති කිසියම් මල් පඳුරකට හෝ නාම පුවරුවකට හෝ වෙනත් ද්‍රව්‍යකට හෝ හානි කිරීම, හෝ අලාභ කිරීම, හෝ විකෘති කිරීම, හෝ විරූපී කිරීම,

IV. පාවිච්චිය සඳහා සපයා ඇති ජලය අපිරිසිදු කිරීම හෝ අපතේ යැවීම, හෝ අපතේ යාමට ඉඩ හැරීම, හෝ වෙනත් කිසියම් ආකාරයකින් නාස්ති කිරීම, හෝ එකී ජලයෙන් ස්නානය කිරීම, රෙදි සහ සතුන් සේදීම සහ එළවළු සහ පළතුරු සේදීමට වෙන් කළ ස්ථානයේ හැර වෙනත් යම් ස්ථානයක එළවළු හෝ පළතුරු සේදීම,

V. විදුලි සම්බන්ධතාවය ලබාදී ඇති ප්‍රධාන යතුරු පුවරුව අසළට ළඟාවීමට බාධා කරන ආකාරයෙන් බඩු භාණ්ඩ තැබීම, හෝ ප්‍රධාන යතුරු පුවරුවට හානි කිරීම,

VI. ජල සම්බන්ධතාවය ලබාදීම සඳහා ගොඩනැගිල්ල තුළ එළා ඇති ප්‍රධාන ජල නළයෙන් හෝ වෙනත් කිසියම් ජල නළයකින් වංචනිකව ජල සම්බන්ධතාවයක් ලබා ගැනීම,

VII. තත් කාර්යය සඳහා වෙන් කළ ස්ථානයක හැර වෙනත් කවර හෝ ස්ථානයක එළවලු මස් හෝ මාළු විකිණීම හෝ ප්‍රදර්ශනය කිරීම හෝ එසේ කිරීමට සැලැස්වීම,

VIII. සතිපොළ පරිශ්‍රය තුළ සකස් කර ඇති වාහන නැවතුම් ස්ථාන හැර වෙනත් ස්ථානවලට පා පැදි හෝ යතුරු පැදි හෝ මෝටර් වාහන රැගෙන ඒම හෝ එසේ කිරීමට ඉඩදීම,

කවර තැනැත්තෙකු විසින් නොකළ යුතු ය.

20. කිසියම් ආසාදන, ස්පර්ශක හෝ චර්ම රෝගයකින් පෙළෙන හෝ මෑතකදී එවැනි රෝගයකින් පෙළෙමින් සිටි කවර හෝ තැනැත්තෙකු හෝ එවැනි කිසියම් රෝගයකින් පෙළෙන යම් තැනැත්තෙකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කවර හෝ තැනැත්තෙකු එකී රෝග ආසාදන සහ බීජ පෝෂණ කාලසීමාව ඉකුත් වී ඇත්තේ නම් මිස සතිපොළෙහි කවර හෝ ආකාරයක වෙළාඳාමක නියුක්ත වීම් හෝ නියුක්ත කරවීම හෝ කිසියම් කාර්යයක නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

21. හොඳින් සෝදා පිරිසිදු කළ ඇඳුම් හැඳ ඇත්තේ නම් මිස කවර හෝ තැනැත්තෙකු විසින් සතිපොළෙහි කවර හෝ ආකාරයක වෙළඳාමක නියුක්ත වීම හෝ නියුක්ත වීමට ඉඩදීම හෝ නොකළ යුතුය.

22. බළන්ගොඩ නගර සභාව විසින් වෙළඳපොළ පරිශ්‍රය වෙන් කර දී ඇත්තේ කිනම් වර්ගයක භාණ්ඩ හෝ ද්‍රව්‍ය වෙළඳාමක් සඳහා ද එසේ වෙන් කරන ලද වර්ගයේ භාණ්ඩ හෝ ද්‍රව්‍ය හැර වෙනත් කවර හෝ ආකාරයක භාණ්ඩ හෝ ද්‍රව්‍ය විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

23. ගෝ ඝාතක ආඥාපනතේ නියමයන් යටතේ විධිමත් බලපත්‍රයක් ලබා ඇති හෝ ගෝ ඝාතකාගාරයක දී මරනු ලැබූ කිසියම් සතෙකුගේ මස් වන්නේ නම් මිස, සති පොළෙහි මස් වෙළෙඳ ස්ථානයක අළෙවි කිරීම සඳහා හෝ අළෙවි කිරීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ ගබඩා කිරීම කවර හෝ තැනැත්තෙකු විසින් නොකළ යුතුය.

24. කවර හෝ ගෝ ඝාතකාගාරයක් තුළ කිසියම් දිනයක දී මස් පිණිස සතුන් මැරීම තහනම් කරමින් ගෝඝාතක ආඥාපනතේ 17 වන වගන්තියේ බලතල ප්‍රකාර නිසි අධිකාරය විසින් නියමයක් *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත්කර ඇති අවස්ථාවක, සතිපොළ ඇතුළත පවත්වාගෙන යනු ලබන කවර හෝ මස් කඩයක වෙළඳාම් කිරීම පිණිස මස් තබා ගැනීම හෝ වෙළඳාම් පිණිස මස් ප්‍රදර්ශනය කිරීම හෝ ගබඩා කිරීම නොකළ යුතුය.

25. කවර හෝ තැනැත්තෙකු විසින් සතිපොළ පරිශ්‍රය ඇතුළතට සුනඛයෙකු හෝ බළලෙකු හෝ වෙනත් කවර හෝ සතෙකු හෝ පක්ෂියෙකු රැගෙන ඒම හෝ රැගෙන ඒමට ඉඩදීම හෝ නොකළ යුතු ය. මේ නියමය කිසියම් පරීක්ෂණ කාර්යයක් සඳහා යම් පොලිස් නිලධාරියෙකු විසින් පොලිස් නිල සුනඛයෙකු සතිපොළ ඇතුළත රැගෙන එනු ලැබීම වළක්වන නියමයක් ලෙස තේරුම් නොගත යුතු ය.

26. කිසියම් සතිපොළක වෙළෙඳ ස්ථානයක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට ලබා ගෙන ඇති කවර හෝ තැනැත්තකු විසින් තමාගේ වෙළෙඳ කාර්යය සඳහා වෙන් කර ගත් එකී වෙළෙඳ ස්ථානයේ ඉඩකඩ නැතහොත් ඉන් කිසියම් කොටසක් කවර හෝ භාණ්ඩ හෝ ද්‍රව්‍ය වෙළඳාම් කිරීමට හෝ වෙළඳාම් කිරීම සඳහා ප්‍රදර්ශනය කිරීමට හෝ වෙනත් කවර හෝ කාර්යයකට වෙනත් යම් තැනැත්තෙකුට ඉඩදීම නොකළ යුතු ය.

27. බළන්ගොඩ නගර සභාව විසින් කලින් තීරණය කර තත් කාර්යය සඳහා බලය දී ඇත්තේ නම් මිස, කවර හෝ තැනැත්තෙකු විසින් සතිපොළෙහි කිසියම් වෙළඳ පරිශ්‍රයක නිර්මිත සැලැස්ම වෙනස් කරන, හෝ එකී සැලැස්මට හානි කරන, හෝ ආකාරයේ කිසිදු ඉදිකිරීමක්, හෝ සවි කිරීමක් හෝ වෙනස් කිරීමක්, හෝ කොටු කිරීමක් නොකළ යුතු ය.

28. සභාපතිවරයාගේ හෝ බලයලත් නිලධාරියෙකුගේ අවසරය ලියවිල්ලකින් ලබා නොගෙන තමන්ට දී ඇති වෙළඳ ස්ථානයේ ආසන්නයේ හෝ ඉඩ ප්‍රමාණයේ යම් කොටසක් කොටුකිරීම හෝ යම් තිරයක් ඇදීම හෝ වහලක් ඉදිකිරීම නැතහොත් යම් තාවකාලික හෝ ස්ථිර වෙනසක් කිරීම ඒ වෙළඳ ස්ථානයේ, ආසන්නයේ හෝ ඉඩ ප්‍රමාණයේ නොකළ යුතු ය.

29. බළන්ගොඩ නගර සභාවට අයත් දේපළක් නොවන කිසිම පෙට්ටියක් මේසයක් පුටුවක් හෝ එවැනි භාණ්ඩයක් සභාපතිවරයාගේ හෝ බලයලත් නිලධාරියාගේ අවසරයකින් තොරව තමාගේ වෙළඳ ස්ථානයට ආසන්නයේ හෝ වෙළඳ ස්ථානයට ගෙන ඒම හෝ එහි තබාගැනීම මෙන්ම ඒ වෙළඳ ස්ථානයේ හෝ වෙළෙඳ ස්ථානය ආසන්නයේ යම් මඩු සෑදීම හෝ වෙනත් උපකරණ සවිකිරීම නොකළ යුතු ය.

30. සතිපොළ පරිශ්‍රයෙහි පොදු පරිභෝජනය සඳහා යොදවා ඇති කිසියම් විදුලි පරිපථයක් හෝ පොදු ජල කරාමයකින් කවර හෝ වෙළෙඳ ස්ථානයට විදුලි සැපයුමක් හෝ ජල සැපයුමක් ලබාගැනීම හෝ එසේ ලබාගැනීමට ඉඩදීම හෝ නොකළ යුතු ය.

31. බළන්ගොඩ නගර සභාවේ සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් කිසියම් සතිපොළක විකිණීමට තබා ඇති හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කර ඇති හෝ ගබඩා කර ඇති කිසියම් ආහාර ද්‍රව්‍යයකින් සාම්පලයක් එහි මිල ගෙවා ලබාගැනීම නීත්‍යානුකූල වියයුතුවාක් හැර කවර හෝ තැනැත්තෙකු විසින් එකී මිළදී ගැනීම ප්‍රතික්ෂේප කිරීම හෝ ඊට බාධා කිරීම නොකළ යුතු ය.

32. පොළට පැමිණෙන යම් තැනැත්තෙකුගේ අත බැලීම, අත බැලීමට යෝජනා කිරීම හෝ ඔහුගේ ජීවන පලාපල කීම ද නොකළ යුතු ය.

33. කවර වර්ගයක බෙහෙත් වර්ග හෝ ඖෂධ වර්ග හෝ අන්තරාදායක හෝ අප්‍රසන්න හෝ අන්තරාදායක වර්ගවලට අයත් ද්‍රව්‍ය හෝ රසායනික ද්‍රව්‍ය හෝ විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රචාරය කිරීම හෝ විකිණීමට තැබීම නොකළ යුතු ය.

34. කවර ආකාරයක ආගමක් ප්‍රචාරය කිරීම හෝ දේශනා කිරීම හෝ ප්‍රසිද්ධ කතා පැවැත්වීම හෝ නොකළ යුතු ය.

35. පොළ භූමියේ හෝ පරිශ්‍රයේ හෝ ඒ අවට ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය වර්ග විකිණීමට තැබීම හෝ ඒ පිළිබඳව ප්‍රචාර පැවැත්වීම, දැන්වීම් පත්‍රිකා බෙදීම හෝ නොකළ යුතු ය.

36. පොළ භූමියේ හෝ පරිශ්‍රයේ හෝ වෙළඳාම් කටයුතු වෙනුවෙන් හෝ වෙන යම් කටයුත්තක් වෙනුවෙන් ශබ්දවාහිනී යන්ත්‍ර හෝ නවීන අධිතාක්ෂණික ශබ්ද තරංග භාවිතා කරමින් ශබ්ද දූෂ්‍ය වන අන්දමින් ප්‍රචාරක කටයුතු හෝ අළෙවි කටයුතු නොකල යුතු ය.

37. ඉහත 36 වන අතුරු ව්‍යවස්ථාවේ එසේ සඳහන් වුව ද කිසියම් වූ හදිසිමයවූත් අත්‍යවශ්‍යවූත් හෝ මහජන අනර්ථකාරී කිසියම් සිද්ධියක් පිළිබඳව හෝ මහජනතාව දැනුවත් කිරීම සඳහා ශබ්දවාහිනී යන්ත්‍රයක් හෝ නවීන අධිතාක්ෂණික ශබ්දතරංග භාවිතා කිරීමට අවසර ලබාදීමට සභාපතිවරයාට හැකියාව ඇත්තේ ය.

38. පොළ භූමියේ ගාස්තු එකතු කිරීම සඳහා හෝ වෙනත් යම් රාජකාරියකට හෝ පැමිණෙන සභාවේ බලයලත් නිලධාරියෙකුට හෝ නිලධාරීන්ට කිසිවකු විසින් බාධා නොකළ යුතු ය.

39. පොළ භාර නිලධාරියා විසින් හෝ ග්‍රාම නිලධාරී විසින් හෝ පොලිස් නිලධාරියෙක් විසින් හෝ සභාපතිගේ බලය පිට ක්‍රියාකරන වෙන යම් කෙනෙකු විසින් පොළ භූමියෙන් පිටවීමට අණකළ විට ඊට සතුටුදායක පිළිතුරක් දිය නොහැකිව ඔහු සමග ආරවුල් ඇතිකර ගැනීම සඳහා එහි නැවති සිටීම හෝ නිකරුණේ ගැවසීම හෝ නොකළ යුතු ය.

40. අලෙවිය සඳහා තබන සියලුම එළවළු, පළතුරු, අලවර්ග හෝ වෙනත් ආහාර ද්‍රව්‍යයන් මහජන සෞඛ්‍යට අහිතකර නොවිය යුතු ය.

41. සභාව විසින් පවත්වාගෙන යනු ලබන කිසියම් සතිපොළක් සම්බන්ධයෙන් මෙම අතුරු ව්‍යවස්ථාවේ පහත සඳහන් නියමයන් පිළිපැදීම බළන්ගොඩ නගර සභාව විසින් කළ යුතු ය.

පළාත් පාලන ආයතනයේ කාර්යභාරය.

42. සතිපොළ පරිශ්‍රය සතිපොළ පැවැත්වෙන දිනට පෙර දින සම්පූර්ණයෙන්ම පිරිසිදු කිරීමත්, සතිපොළ පැවැත්වෙන දිනය අවසානයේ දී නැවත වතාවක් සම්පූර්ණයෙන්ම පිරිසිදු කිරීමත් බළන්ගොඩ නගර සභාවේ කාර්යය වන්නේ ය.

43. සතිපොළෙහි ඇති සෑම වැසිකිළියක්ම හා කැසිකිළියක්ම සතිපොළ පැවැත්වෙන සෑම දිනයකදීම අවම වශයෙන් දිනකට වතාවක් බැගින් විෂබීජ නාශක යොදා සෝදා හැරීමෙන් පිරිසිදු කිරීමටත් ජලය ගලා යාමට ඉදිකර ඇති සෑම කාණුවක්ම සතිපොළ පැවැත්වෙන දිනයේදී දිනකට වතාවක් බැගින් සෝදා පිරිසිදු කිරීමටත් සැලැස්වීම නගර සභාවේ කාර්යය වන්නේ ය.

44. 12 වන වගන්තියේ නියම කර ඇති ආකාරයෙන් තනා ඇති සෑම බක්කියක, භාජනයක හෝ ටැංකියක්ම රැස් කරනු ලබන අපද්‍රව්‍ය, සතිපොළ පැවැත්වෙන සෑම දිනයකදීම අවම වශයෙන් දිනකට එක් වතාවක් හෝ අවශ්‍ය වන්නේ නම් ඊට වඩා වැඩි වාර ගණනකින් එකී ස්ථානයෙන් ඉවත් කිරීමට සැළැස්වීම බළන්ගොඩ නගර සභාවේ කාර්යය විය යුතු ය.

45. බළන්ගොඩ නගර සභාව විසින් පවත්වාගෙන යනු ලබන කිසියම් සති පොළක් විවෘතව තැබිය යුතු දිනයන් සහ වේලාවන් කලින් කල සභාව විසින් තීරණය කරනු ලැබිය හැකිය. සභාව විසින් එසේ තීරණය කරනු ලැබූ ආකාරයට සතිපොළ විවෘතව තබන දිනයන් සහ වේලාවන් කවරේද යන්න භාෂාත්‍රයෙන්ම දැන්වීමක් හෝ දැන්වීම් ප්‍රකටව පෙනෙන ආකාරයෙන් සතිපොළට ඇතුළු වීමේ දොරටුව අසළ ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

46. පොළ පිහිටි භූමිය තුළ සාමය පවත්වා ගැනීම සභාව විසින් පත්කරනු ලබන සහ පොළ භූමිය තුළ රාජකාරියේ යෙදී සිටින නිළධාරියෙකු හෝ නිළධාරීන් විසින් කළ යුතු ය.

47. බඩු මිළදීගැනීම සඳහා හෝ විකිණීම සඳහා පොළට පැමිණෙන සෑම තැනැත්තෙකු විසින්ම සභාවේ නිලධාරියෙකු විසින් හෝ පොලිස් නිළධාරියෙකු විසින් හෝ කිසියම් ආරවුලක් නිරවුල් කිරීම සඳහා හෝ සාමය ආරක්ෂා කිරීම සඳහා කරනු ලබන යම් නිත්‍යානුකුල නියෝගයක් පිළිපැදිය යුතු ය.

ගාස්තු හා අයකිරීම.

48. සතිපොළ වෙළඳ ස්ථානවල වෙළඳාමේ නිරත වන ඕනෑම තැනැත්තෙකු බළන්ගොඩ නගර සභාව මඟින් මෙම අතුරු ව්‍යවස්ථාවේ පළමු වන උපලේඛනයට සාරානුකූලව පිළියෙල කල, අවසර පත්‍රයක් නියමිත ගාස්තු ගෙවා ලබාගෙන ඇත්තේනම් මිස කිසිදු වෙළඳ කාර්යයක නිරත නොවිය යුතුය. එකී ගාස්තු ප්‍රමාණයන් බළන්ගොඩ නගර සභාව විසින් පැනවීම, කලින් කල වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

49. සතිපොළෙහි වෙළඳ ස්ථාන පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට අවශ්‍ය කරන යම් තැනැත්තන්ට අවසර පත්‍ර නිකුත් කිරීමට හා එකී අවසර පත්‍ර සඳහා මුදල් අය කිරීමටත් ලේකම්වරයාගේ බලයලත් යම් නිලධාරියෙකු යොදවනු ලැබිය හැකි ය.

50. අවසරපත්‍රයක් නිකුත් නොකර කිසිඳු අවස්ථාවකදී සතිපොළෙහි මුදල් අයනොකළ යුතු අතර, විධිමත් පරිදි අයකරනු ලබන මුදල් සභාවෙන් නියම කර ඇති පරිදි නගරසභා අරමුදලට බැර කිරීම මුදල් අයකරන්නාගේ කාර්ය වන්නේ ය.

51. සති පොළෙහි කඩ සහ වෙළඳ මැහි පාවිච්චි කිරීම හෝ පරිහරණය කිරීමට යම් තැනැත්තන්ට අවසරපත්‍ර නිකුත් කිරීම සහ ඒ සඳහා මුදල් එකතු කිරීම 48 වන අතුරු ව්‍යවස්ථාවේ නියමකර ඇති ආකාරයෙන් ලේකම්වරයාගේ බලයලත් යම් නිලධාරියෙකු යෙදවීමට නොහැකි වන්නේ නම් එකී කාර්යය ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීම් මගින් තෝරාගනු ලබන තැනැත්තෙකුට පැවරීමට බළන්ගොඩ නගර සභාවට බලය තිබිය යුතු ය.

52. 51 වන අතුරු ව්‍යවස්ථාව යටතේ තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුට එකී කාර්යය පැවරීම එක් වර්ෂයක් සඳහා පමණක් වලංගු විය යුතු අතර, අනුගාමී වර්ෂය සඳහා නැවත ටෙන්ඩර් කැඳවීමක් මගින් ටෙන්ඩර්කරුවෙකු තෝරා ගත යුතු ය. එසේ වුව ද කලින් වර්ෂය සඳහා තෝරා ගනු ලැබූ කිසියම් ටෙන්ඩර්කරුවෙකුට අනුගාමී වර්ෂය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කිරීමට සහ එකී ටෙන්ඩර් අයදුම් පත්‍රය පිළිගැනීමට සභාව තීරණය කරන්නේ නම් ඔහු අනුගාමී වර්ෂය සඳහා ටෙන්ඩර්කරු වශයෙන් තෝරාගැනීමටත් මේ අතුරු ව්‍යවස්ථාවේ නියමයන් මගින් වළක්වා ඇති ලෙස තේරුම් නොගත යුතු ය.

53. 48 අතුරු ව්‍යවස්ථාවේ නියමයන් යටතේ කිසියම් සතිපොළක වෙළඳ ස්ථාන පාවිච්චි කිරීමට බළන්ගොඩ නගර සභාව විසින් තීරණය කරනු ලැබ ඇති ගාස්තු ඉක්මවූ ප්‍රමාණයක ගාස්තුවක් හෝ ගාස්තු අය කිරීමක් කවර හෝ ගාස්තු එකතු කරන්නෙකු විසින් නොකළ යුතු ය.

54. සතිපොළේ ගාස්තු එකතු කිරීම සඳහා තෝරාගනු ලබන ටෙන්ඩර්කරු සමග විධිමත් ගිවිසුමකට එළඹීමට සභාව පියවර ගත යුතු ය.

අභිමතයන් හා සුවිශේෂයන් බලතල පැවරීම.

55. සතිපොළෙහි කිසියම් වෙළඳ ස්ථානයක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට 50 අතුරු ව්‍යවස්ථාව යටතේ අවසර පතක් ලබාගෙන ඇති කවර හෝ තැනැත්තෙකු විසින් එකී අවසර පත්‍රය අන්සතු කිරීම හෝ එකී අවසර පත්‍රය නිකුත් කරනු ලැබ ඇත්තේ කිනම් වෙළඳ පරිශ්‍රයක් සඳහා ද එකී වෙළඳ පරිශ්‍රය නොවන වෙනත් කිසියම් පරිශ්‍රයක වෙළඳාම් කිරීම නොකළ යුතු අතර, කවර හෝ තැනැත්තෙකු එසේ ක්‍රියා කර තිබෙන බවට බළන්ගොඩ නගර සභාවේ සභාපතිවරයා හෝ බලයලත් නිළධාරි සෑහීමකට පත් වී ඇති අවස්ථාවක, ඔහු නියමිත ස්ථානයේ වෙළඳාම් සඳහා යොමු කිරීමට නැතහොත් එකී දිනයේ දී වෙළඳාම් කටයුතු වලින් වලක්වා සති පොළෙන් ඉවත් කිරීම හෝ ඔහු වෙත නිකුත් කරනු ලැබූ අවසර පත්‍රය අවලංගු කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිළධාරියාට බලය තිබිය යුතු ය.

56. සභාව මඟින් නිකුත් කරන ලද වලංගු අවසර පත්‍ර දරන්නන් අතර හෝ එකී අවසර පත්‍ර දරන්නන්ගේ බලයට යටත් සේවකයින් අතර හෝ අවසර පත්‍ර දරන්නන් හා මහජනයා අතර සතිපොළ පාවිච්චි කිරීම සම්බන්ධයෙන් ඇති වන යම් ආරවුලක් සභාපති විසින් හෝ සභාපති විසින් බලය පවරන ලැබූ ඕනෑම නිලධාරියෙකු විසින් නිරවුල් කළ හැකි ය.

පරීක්ෂණ ක්‍රියාවලින් පැමිණිලි, සහන සැලසීම සහ අධීක්ෂණය.

57. සතිපොළ පිහිටි භූමිය ඇතුළත විකිණීම සඳහා ප්‍රදර්ශනය කොට ඇති යම් ආහාර ද්‍රව්‍යයක් ආහාර පිණිස යෝග්‍ය නොවන බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ මතය වන්නේ නම් සභාපති විසින් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් හෝ සභාපතිවරයාගේ බලය යටතේ ක්‍රියා කරන යම් සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු විසින් ඒ ආහාර ද්‍රව්‍ය පරීක්ෂා කොට තහනමට ගැනීම නීත්‍යානුකූල විය යුතු ය.

58. කිසියම් අවස්ථාවක අළෙවිය සඳහා තබා ඇති කිසියම් වූ ආහාර ද්‍රව්‍යයක් අපථ්‍යයයි හෝ මහජන පරිභෝජනයට නුසුදුසුයැයි පෙනී ගිය හොත් එම තොගය හෝ තොග තහනම් කර මහජන සෞඛ්‍ය පරීක්ෂක වෙත ඉදිරිපත් කිරීම සභාවේ බලයලත් නිලධාරියෙකු විසින් සිදු කළ යුතු ය.

59. එසේ ඉහත 57 වන ව්‍යවස්ථාවට අනුව මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් එකී ආහාර ද්‍රව්‍ය තොගය පරීක්ෂාකර මහජන පරිභෝජනයට නුසුදුසුයැයි තීරණයකර විනාශ කිරීමේ දී ඒ වෙනුවෙන් කිසිඳු වන්දියක් නොගෙවිය යුතු ය.

60. එසේ ඉහත 59 වන ව්‍යවස්ථාව පරිදි මහජන පරිභෝජනයට නුසුදුසු හෝ අපථ්‍යයි ආහාර ද්‍රව්‍ය අළෙවියට තබන කිසියම් වූ වෙළෙන්දෙක් හට නිසි අධිකරණයකට ඉදිරිපත්කර දඬුවමක් ලබාදිය හැකි ය.

61. එසේ 60 වන වගන්තිය අනුව අධිකරණයෙන් වරදකරුවෙකු වන තැනැත්තෙකුට නැවත පොළ භූමියේ වෙළඳාම් කිරීම සඳහා පැමිණීමට හෝ පැමිණීමට ඉඩ නොදීම පිළිබඳ තීරණය කිරීමට සභාවට බලය ඇත්තේ ය.

62. කිසියම් පුද්ගලයෙකු විසින් සතිපොළ සම්බන්ධයෙන් යම් සහනයක් අපේක්ෂා කරන්නේ නම් ලිඛිතව කරනු ලබන එකී සහන අයදුම පිළිබඳ තීරණය කිරීමට බළන්ගොඩ නගර සභාවට හැකියාව ඇත්තේ ය.

63. සතිපොළ සම්පූර්ණ අධීක්ෂණ කටයුතු බළන්ගොඩ නගර සභාව විසින් සිදු කළ යුතු ය.

අතුරු ව්‍යවස්ථා උල්ලංඝනය.

64. මෙම අතුරු ව්‍යවස්ථාමාලාවේ ඇතුළත් ඕනෑම අතුරු ව්‍යවස්ථාවක් හෝ අනු අතුරු ව්‍යවස්ථාවක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ කඩකිරීම, පැහැර හැරීම, නොකර සිටීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන්නේ ය.

දණ්ඩනයන්.

65. මෙම අතුරු ව්‍යවස්ථාවේ ඇතුළත් ඕනෑම වගන්තියක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර කිසියම් තැනැත්තෙකු විසින් අධිකරණයකින් වරදකට වරදකරු කරනු ලැබූ විට 1939 අංක 61 දරණ නගර සභා ආඥා පනතේ හෙවත් 255 වන අධිකාරයේ 153 (2) වගන්තිය අනුව නියම කර ඇති දඩයකින් ද වරදකරු කරනු ලැබීමකින් පසුව ද එම වරද දිගින් දිගටම කරගෙන යනු ලබයි නම් එකී කඩ කිරීම කෙරෙහි අවධානය යොමුකරමින් බළන්ගොඩ නගර සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා හෝ ඔහු විසින් බලය පවරනු ලබන වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසුවද ඒ වරද කරගෙන යන සෑම දිනයක් සඳහාම 1939 අංක 61 දරණ නගර සභා ආඥා පනතේ හෙවත් 255 වන අධිකාරයේ 153 (2) වගන්තිය අනුව නියමකර ඇති අතිරේක දඩයකට යටත්විය යුතු ය.

66. මෙම අතුරු ව්‍යවස්ථාවේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍ර පිටපත්වල අදහස් අතර කිසියම් නොගැලපීමක් ඇතිවුවහොත් සිංහල පිටපතෙහි දැක්වෙන අදහස බලාත්මක විය යුතු ය.

67. මෙම අතුරු ව්‍යවස්ථා මාලාවේ කිසියම් වූ අතර ව්‍යවස්ථාවක් හෝ අනු අතුරු ව්‍යවස්ථාවක් හෝ අතුරු ව්‍යවස්ථා කිහිපයක් හෝ සමස්ත අතුරු ව්‍යවස්ථා මාලාවම හෝ සංශෝධනය කිරීමට හෝ පරිච්ඡින්න කිරීමට බළන්ගොඩ නගර සභාවට බලය ඇත්තේ ය.

අර්ථ නිරූපනය

68. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල :

''සභාව''යන්නෙන් බළන්ගොඩ නගර සභාව ද,

''සභාපති'' යන්නෙන් බළන්ගොඩ නගර සභාවේ සභාපති හෝ එකී ධූරයට අනුප්‍රාප්ත වන්නෙක් ද,

''ලේකම්'' යන්නෙන් බළන්ගොඩ නගර සභාවේ ලේකම් ද,

''නිළධාරියා'' යන්නෙන් බළන්ගොඩ නගර සභාවේ සභාපති හෝ ලේකම් විසින් යොදවනු ලබන නිළධාරියෙක් හෝ සේවකයෙක් ද,

'' සතිපොළ'' යන්නෙන් බළන්ගොඩ නගර සභාව විසින් නම්කර පවත්වනු ලබන සතිපොළ හෝ සතිපොළවල් ද,

''වෙළෙන්දා'' යන්නෙන් සතිපොළ භූමියේ කිසියම් භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් අළෙවි කිරීම සඳහා රැගෙන එන ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම ද,

''පාරිභෝගිකයා'' යන්නෙන් වෙළඳාමට තබා ඇති භාණ්ඩ හෝ ද්‍රව්‍ය මිළ දී ගැනීමට පැමිණෙන ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම ද,

''කිසිවෙක්'' යන්නෙන් පොළ භූමියට පැමිණෙන වෙළඳ, පාරිභෝගික, නිළධාරී, ස්ත්‍රී, පුරුෂ පූජ්‍ය, පූජක සියළුදෙනාම ද,

අදහස් වේ.

**(අ) උප ලේඛනය**

**විශේෂ බලපත්‍රය**

මෙම බලපත්‍රය අයිතිකරු වන ...................................................................... පදිංචි ................................................................ බිත්තර, හකුරු, පළතුරු, එළවළු, ධාන්‍ය වර්ග හෝ අල වර්ග හෝ හේන්වල හෝ වතුවල එලදාව හෝ වෙනත් බඩුවක් බළන්ගොඩ ඉරිදා පොළේ දී ................................ දින පෙ.ව. .............................. සිට ප.ව ............................දක්වා කාලය තුළ පොළභාර නිලධාරියා විසින් හෝ සභාපති විසින් ලියවිල්ලකින් බලය පවරන ලද නිලධාරියා විසින් ඔහුට වෙන්කොට දෙනු ලැබිය හැකි වෙළඳ මැස්සේ හෝ ඉඩ ප්‍රමාණයෙහි වෙළඳාම් කිරීමට මෙයින් බලය දෙනු ලැබේ.

| රු. |
|---|

.....................................................
සභාපති/බලයලත් නිලධාරියා.

දිනය :...................................

08-1222